# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා මනෝ සමාජ වැඩ වෘත්තීයවේදී ආයතනය (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා මනෝ සමාජ වැඩ වෘත්තීයවේදී ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා විසින්
2015 නොවැම්බර් මස 06 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 ඔක්තෝබර් මස 12 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[21 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# ශ්‍රී ලංකා මනෝ සමාජ වැඩ වෘත්තීයවේදී ආයතනය (සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී ලංකා මනෝ සමාජ වැඩ වෘත්තීයවේදී ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

මනෝ සමාජ වැඩ ක්ෂේත්‍රයේ නියැලී සිටින තැනැත්තන් අතර මනෝ සමාජ වැඩ වෘත්තීයවේදය හඳුන්වා දීම හා ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා සහ එකී ක්ෂේත්‍රයේ නියැලී සිටින තැනැත්තන් අතර ඉහළ ම වෘත්තීය ප්‍රමිතීන් පවත්වා ගෙන යාමේ කාර්යය සඳහා කැප වූ වෘත්තීයවේදීන් කණ්ඩායමක් විසින් "ශ්‍රී ලංකා මනෝ සමාජ වැඩ වෘත්තීයවේදී ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන සහ ප්‍රකට ආයතනයක් ශ්‍රී ලංකාවේ පිහිටුවනු ලැබූ හෙයින් ද:

1998 අංක 08 දරන පනතින් සංශෝධිත 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජසේවා සංවිධාන (ලියාපදිංචිය හා අධීක්ෂණය) පනතේ 5(2) වන වගන්තිය යටතේ වර්ෂ දෙදහස් හතක් වූ ඔක්තෝබර් මස තිස් එක් වන දින ඉහත කී ආයතනය ස්වේච්ඡා සමාජ සේවා ආයතනයක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ හෙයින් ද:

1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත හා 1995/09/17 දිනැති අංක 887/8 දරන ගැසට් නිවේදනය මඟින් අධ්‍යාපන තෘතීයික හා වෘත්තීය කොමිෂන් සභාව විසින් පුහුණු ආයතනයක් හැටියට පිළිගෙන ලියාපදිංචි අංක P 20/0052 යටතේ මෙම ආයතනය ලියාපදිංචි කර ඇති හෙයින් ද:

මනෝ සමාජ වැඩ වෘත්තීයවේදයේ පොදු අභිවෘද්ධිය සඳහා සහ එකී ආයතනයේ සමාජිකයන් එකඟ වූ ව්‍යවස්ථාවලට අනුව එකී ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ඉහත කී ආයතනය පාර්ලිමේන්තු පනතක් මඟින් සංස්ථාගත කිරීමට ආයතනය විසින් විශේෂ යෝජනා සම්මතයක් මගින් සම්මත කරගෙන ඇති බැවින් ද:

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී ආයතනය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද, එකී ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එසේ සංස්ථාගත කිරීම මහජන යහපතට හේතු වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2015 අංක  දරන ශ්‍රී ලංකා මනෝ සමාජ වැඩ වෘත්තීයවේදී ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2—PL 009262 — 300 (2015/10)

ශ්‍රී ලංකා මනෝ සමාජ වැඩ වෘත්තීයවේදී ආයතනය සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන්පසු (මෙහි මින් මතු “ආයතනය” යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මනෝ සමාජ වැඩ වෘත්තීයවේදී ආයතනයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මනෝ සමාජ වැඩ වෘත්තීයවේදී ආයතනය යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවීමට හේතු වූ පොදු පරමාර්ථ පහත දැක්වෙන ඒවා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ගුණාත්මක මනෝ සමාජ වැඩ පරිචයේ ප්‍රමිතිය ඉහළ නැංවීම සහ මනෝ සමාජ වැඩ වෘත්තියේ නියැලී සිටින සාමාජිකයන්ගේ වෘත්තීය ආචාරධර්ම, ගෞරවය, අයිතීන්, බලතල හා වරප්‍රසාද ප්‍රවර්ධනය, පෝෂණය හා ආරක්ෂා කිරීම ;

(ආ) මනෝ සමාජ වැඩ වෘත්තිකයන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වැඩිදියුණු කිරීමට අවශ්‍ය මනෝ සමාජ වෘත්තීය අධ්‍යාපනය, පුහුණුව, පර්යේෂණ හා ප්‍රකාශන ක්ෂේත්‍රයන්හි නව උපාය මාර්ග හඳුන්වා දීම හා ඒ තුළින් ප්‍රජාව සංවර්ධනය කිරීම හා බල ගැන්වීම ;

(ඇ) සමාජ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම සහ ඒ හා බැඳුණු නව සමාජ ප්‍රතිපත්ති හඳුන්වා දීමට සහාය වීම ;

(ඈ) මනෝ සමාජ වැඩ වෘත්තිය පවත්වාගෙන යෑමේ දී ද, වෘත්තීයමය ආචාර ධර්ම හා ප්‍රමිතීන් නියම කිරීමේදී ද අතිශය වැදගත් කාර්ය භාරයක් ඉටු කිරීමේ හැකියාව ඇති එක ම වැදගත් සංවිධානයක් වශයෙන් ශ්‍රී ලංකාවේ මනෝ සමාජ වැඩ ක්ෂේත්‍රයේ නියැලෙන සියලු සාමාජිකයන් එම ආයතනය තුළ ගොනු කිරීම ;

(ඉ) ආයතනයේ සුභ සිද්ධිය හා යහපත උදෙසා මෙන් ම මහජන සුභ සාධනය පුළුල් කිරීම උදෙසා ආයතනයේ සාමාජිකයන් අතර මෙන් ම වෙනත් සමාන වූ වෘත්තීන් හා ආයතන අතර මිත්‍රත්වය හා සහයෝගිතාව වර්ධනයට කටයුතු කිරීම ;

(ඊ) මනෝ සමාජ වැඩ වෘත්තීයවේදය පිළිබඳ හොඳින් දැනුවත් සුදුසුකම් සහිත පිරිසක් බවට පත් කිරීම සඳහා මනෝ සමාජ වැඩ වෘත්තිකයන් බවට පත්වීමේ ශක්‍යතාව ඇති අය වෙත ඔවුන්ට අදාළ හා යාවත්කාලීන තොරතුරු සැපයීම ;

(උ) ආයතනයේ සාමාජිකයන්ගේ වෘත්තීයමය අවශ්‍යතා, අයිතිවාසිකම්, බලතල හා වරප්‍රසාද ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ඌ) වෘත්තීය මනෝ සමාජ වැඩ සේවාව පවත්වා ගෙන යනු ලබන වෘත්තිකයන් පිළිබඳව නාමලේඛනයක් සකස් කර පවත්වා ගෙන යාම ;

(එ) වෘත්තීය මනෝ සමාජ වැඩ වෘත්තිකයන්ගේ සේවා පහසුකම් වැඩිදියුණු කිරීමේ අටියෙන් ඒ සඳහා අවශ්‍ය නෛතික නියෝග පැනවීම සහ අවශ්‍ය නීතිමය ව්‍යවස්ථා හඳුන්වා දීම මෙන් ම ඊට ආවේණික වූ අයිතිවාසිකම් හා සමාජ වගකීම් ආරක්ෂා කර රැක ගැනීම ;

(ඒ) ශ්‍රී ලංකාව තුළ මෙන් ම ඉන් පිටත පවතින රැකියා සහ වෘත්තීයමය අවස්ථා පිළිබඳ තොරතුරු සාමාජිකයන් වෙත සැපයීම ;

(ඔ) වෘත්තීය මනෝ සමාජ වැඩ සේවාව යනු කුමක් ද යන්න පිළිබඳවත්, එය සුවිශේෂී හා විස්තීර්ණ සමාජ සේවා ක්‍රමයක් වන්නේ කුමක් නිසා ද යන්න පිළිබඳවත් මහජනතාවට අවශ්‍ය අධ්‍යාපනය ලබා දීම ;

(ඕ) ශ්‍රී ලංකාව පුරා මෙන් ම ඉන් බාහිර රටවල සාමාජිකයන් සමඟ අන්තර් සබඳතාව ඇති කෙරෙන ආකාරයේ අවස්ථාවන් නිර්මාණය කර ඒවා ජාලගත කිරීම සම්බන්ධීකරණය කෙරෙන වේදිකාවක් නිර්මාණය කිරීම ;

(ක) වෘත්තීය මනෝ සමාජ වැඩ සේවාව වඩාත් ශක්තිමත් කිරීම සඳහා සාමාජිකයන් වෙනුවෙන් පර්යේෂණ කටයුතු, ව්‍යාපෘති හා වෙනත් එවන් කටයුතු සඳහා අවස්ථාව ලබා දීම සහ පහසුකම් සැපයීම ;

(ග) මනෝ සමාජ වැඩ ක්‍රමය භාවිතා කරන්නන් සඳහා වෘත්තීයමය ප්‍රමිතීන් හඳුන්වා දීම සහ එකී ප්‍රමිතීන් ඔවුන්ගේ වෘත්තීයමය කටයුතුවල දී යොදා ගනු ලැබීම සහතික කිරීම ;

(ජ) සංස්ථාවේ අරමුණු සියල්ල ම හෝ කිසිවක් සාධනය කර ගැනීම සහ එවන් අයිතිවාසිකම්, වරප්‍රසාද, පහසුකම්, වෘත්තීයමය සංගමයකට ගැලපෙන ආකාරයට ප්‍රවර්ධනය කිරීමේ අදහසින් රජය හා ඊට සම්බන්ධ ආයතන සමග ගිවිසුම්වලට එළඹීම ;

(ඩ) මනෝ සමාජ වැඩ තුළින් සමාජ හා ප්‍රජා සංවර්ධන කටයුතුවල දී රජයට හා රජය පිළිගත් රාජ්‍ය නොවන ආයතනවලට අප ආයතනයේ සාමාජිකයන් වෙතින් වෘත්තීයමය හා විශේෂඥ සේවාවන් ලබා දීමේ අවස්ථාවන් නිර්මාණය කිරීම ;

(න) මනෝ සමාජ වැඩ සම්බන්ධයෙන් උනන්දුවක් ඇති අය සඳහා ගුණාත්මක බවකින් යුතු වැඩමුළු, පාඨමාලා, සම්මන්ත්‍රණ, ව්‍යාපෘති සහ විභාග හඳුන්වා දීම හා පවත්වා ගෙන යාම හා අවශ්‍ය මට්ටමට ළඟා වන අය සඳහා සහතික පත්‍ර ප්‍රදානය කිරීම ;

(ත) සියලු සමාජ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් සම්බන්ධයෙන් නව සමාජ ප්‍රතිපත්ති හඳුන්වා දීම ; සහ

(ප) ශ්‍රී ලංකාව තුළ මනෝ සමාජ වැඩ වෘත්තියේ නියැලෙන්නන්ගේ සුභ සිද්ධිය හා ප්‍රවර්ධනය උදෙසා අවශ්‍ය විය හැකි වෙනත් ක්‍රියාමාර්ග ගැනීම.

සංස්ථාවේ බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් කවර හෝ ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් කටයුතු, එනම් :—

(අ) මෙරට හෝ පිටරට අරමුදල් රැස්කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම හා දායක මුදල් ඉල්ලා ලබා ගැනීම ;

(ආ) චංචල හෝ නිශ්චල දේපළ කවර හෝ ආකාරයකින් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සහ සංස්ථාවේ කටයුතු සඳහා අවශ්‍ය හෝ පහසුවක් වන යම් ගොඩනැගිලි හෝ නිර්මාණ ඉදිකිරීම, නඩත්තු කිරීම සහ ඒවායේ වෙනස්කම් කිරීම ;

(ඇ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වා ගෙන යාමේ සහ වැසීම හා ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහා ම අවශ්‍ය නොවන මුදල් 5 වන වගන්තිය යටතේ යථා පරිදි තෝරා පත් කර ගනු ලැබූ විධායක සභාව විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීම ;

(ඉ) යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට ඇතුළත් වීම ;

(ඊ) සංස්ථාව විසින් සපයනු ලබන සේවා සඳහා ගාස්තු අය කිරීම ;

(උ) සංස්ථාවේ සාමාජිකයකුව සිටි තැනැත්තකු නැවත ඇතුළත් කර ගැනීම සඳහා සංස්ථාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ ගාස්තු අය කිරීම ;

(ඌ) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීමට, සේවයේ නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීම හා සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා හා පාරිතෝෂික දීමනා ගෙවීම ; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූල වෙනත් සියලු දේ කිරීම සඳහා,

සංස්ථාවට බලය ඇත්තේය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය.

**5.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවල විධිවිධාන සලස්වා තිබෙන පරිදි හා ඒ රීතිවලට අනුකූලව තෝරා

පත්කර ගනු ලබන නිලධරයන්ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වූ විධායක සභාවක් වෙත මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව පැවරෙන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වූ දිනයේ දී ආයතනයේ විධායක සභාවේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම විධායක සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සාමාජික නාමලේඛනය.

**6.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකුගේ ම සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරනු ලබන සෑම තැනැත්තකුගේ ම නම ඇතුළත් කළ යුතු සාමාජික නාමලේඛනයක් සභාව විසින් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාවේ රීති.

**7.** (1) සංස්ථාව විසින් සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් මේ පනතට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් ඉවත් කිරීම හෝ නෙරපීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම ;

(ආ) සභාව තෝරා පත්කර ගැනීම, සභාවේ නිලධරයන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම හෝ ධුර අත්හැරීම සහ සභාවේ බලතල, කාර්ය සහ සභාව ක්‍රියා කළ යුතු ආකාරය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය හා ඔවුන් පත් කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ සේවය අවසන් කිරීම ;

(ඈ) සභාවේ, සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය හා එම රැස්වීම් කටයුතු කරගෙන යා යුතු ආකාරය ද ඇතුළුව රැස්වීම් කැඳවීම, පැවැත්වීම පිළිබඳ කාර්ය පටිපාටිය ;

(ඉ) සංස්ථාවේ සහ සභාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලපැවැත්වූ ආයතනයේ ව්‍යවස්ථා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතයක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම රීති මේ වගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් මෙන් එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. (1) මේ පනත ක්‍රියාත්ම වීම ආරම්භ වන දින සිට—

(අ) ආයතනයට අයත්ව තිබූ චංචල හෝ නිශ්චල සියලු දේපළ ද;

(ආ) ආයතනයේ සියලු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද සහ සම්බන්ධතා සහ ආයතනයේ සියලු බැරකම් ද ;

(ඇ) ආයතනයේ සියලු පොත්, ගිණුම් සහ ලේඛන ද,

සම්පූර්ණයෙන් සංස්ථාව වෙත සතු විය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොවන පරිදි—

(අ) ආයතනයට ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ ගාස්තු සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය ;

(ආ) මේ පනත ක්‍රියාත්ම වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දින සිට ආයතනයේ සියලු බැරකම්, සංස්ථාවේ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඇ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දින සිට ආයතනයේ සියලු නිලධරයන් සහ සේවකයන් සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඈ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව වූ දින සිට පැවැති ආයතනයේ කාර්ය සඳහා ඇතුළත් වූ සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම්, සංස්ථාව විසින් ඇතුළත් වූ කොන්ත්‍රාත් සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඉ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දින සිට විනිශ්චයට භාජනයව පැවතියා වූ, ආයතනය විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබ ඇත්තා වූ සියලු නඩු හා නඩු කටයුතු, සංස්ථාව විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරන ලද නඩු හෝ නඩු කටයුතු හෝ ලෙස සලකනු ලැබිය යුතු ය.

**9.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, ප්‍රදාන, පරිත්‍යාග, දායක මුදල් හෝ ගාස්තු, මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් තිබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාවට ලැබෙන සියලු මුදල් සභාව විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු අතර, සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වන පරිදි එම මුදල් ආයෝජනය කළ යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටුකිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

*ගිණුම් සහ විගණනය.*

**10.** (1) සංස්ථාව විසින් සංස්ථාවේ ආදායම හා වියදම, වත්කම්, සහ බැරකම් සහ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට සලස්වනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් යටත් පිරිසෙයින් වර්ෂයකට වරක් පරීක්ෂා කර විධායක සභාව විසින් තීරණය කරනු ලබන සුදුසුකම් සහිත විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

*ආයතනය විසින් සහ ආයතනයට ගෙවිය යුතු ණය.*

**11.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ආයතනයේ පැවති සියලු ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර එදිනට ආයතනයට ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ ගාස්තු මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

*කම්වුු පත් කිරීමේ බලතල.*

**12.** සංස්ථාවේ වෘත්තීයමය තත්ත්වය පවත්වා ගෙන යාම සහ සාමාජිකයන් අතර විනය පවත්වා ගැනීම උදෙසා කලින් කල යම් කමිටු පත් කිරීම සහ අවශ්‍ය අනෙකුත් කටයුතු කිරීම සඳහා සංස්ථාවට බලය ඇත්තේ ය.

*සංස්ථාවේ මුද්‍රාව.*

**13.** ලේකම්වරයා හෝ සභාව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ සභාවේ සාමාජිකයකු හා සභාවේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

*සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.*

**14.** සංස්ථාවේ කිසිම සාමාජිකයෙක් සංස්ථාවට අයවිය යුතු ග්‍රාහක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ගෙවීමට යටත් නොවන්නේ ය.

*ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

**15.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මඟින්, ඔවුන්ගේ හෝ ඔවුන් යටතේ හෝ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**16.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.